IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස

## 2016/2017 - ප්‍රථම සෙමෙස්තරය

(පවත්වන ලද්දේ 2018 දෙසැම්බර්)

## BLE 101 – සූක්ෂම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(2) පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1 කොටස

01. පහත ප්‍රකාශ සත්‍යද අසත්‍ය ද යන්න දක්වා ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

i. "සංවර්ධිත රටවල ඒක පුද්ගල ආදායම ඉහල මට්ටමක පවතින නිසා එම රටවල් මූලික ආර්ථික ප්‍රශ්නවලට මුහුණ පාන්නේ නැත".

ii. "භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියට අදාළව ආවස්ථික පිරිවැය සෑම විටම ස්ථාවර අගයක් ගනී".

iii. "නම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩවල මිල ඉහල ගිය විට පාරිභෝගිකයා ඒ මත දරන මුළු වියදම අඩු වේ".

iv. "අනම්‍ය භාණ්ඩයක් මත බදු පැනවූ විට වැඩි බදු බරක් නිෂ්පාදකයා දරයි".

v. "සම නිෂ්පාදන වක්‍රයක් දිගේ ඉහල සිට පහළට ගමන් කරන විට නිෂ්පාදනය ක්‍රමයෙන් අඩු වේ".

vi. "පාරිභෝගිකයා සෑම විටම උත්සාහ දරන්නේ මූල ලක්ෂයෙන් ඈත්ව පිහිටා ඇති උපේක්ෂා වක්‍රයකට ළඟා වීමටය".

vii. "කෙටිකාලයේදී ස්ථාවර පිරිවැය වැඩි වන විට ආන්තික පිරිවැය ද වැඩි වේ".

viii. "කෙටිකාලයේදී ශ්‍රම සාධකය වැඩි කරන විට නිෂ්පාදනය සෑම විටම වැඩි වේ".

(ලකුණු 40)

II කොටස

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

02.

i. ලෝකයේ ඕනෑම ආර්ථිකයක් මුහුණ පාන මූලික ආර්ථික ගැටළු මොනවාද? එම ගැටළු විසදා ගන්නා ප්‍රධාන ක්‍රමවේද මොනවාද?

(ලකුණු 07)

ii. ඉහත ඔබ සඳහන් කළ ගැටළු ලංකාවේ විසදා ගන්නේ කෙසේද?

(ලකුණු 08)

03.

i. භාණ්ඩයක් සඳහා ඇති පාරිභෝගික ඉල්ලුම තීරණය කරන සාධක මොනවාද?

(ලකුණු 07)

ii. සැපයුම් න්‍යායට අනුව භාණ්ඩයක මිල හා සැපයුම් අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින නමුත් වර්තමානයේ ජංගම දුරකථන වල මිල අඩු වුවද සැපයුම ද වැඩි වී ඇත. මෙවැනි තත්ත්වයක් ඇති වී ඇත්තේ කෙසේද?

(ලකුණු 08)

04.

i. කෙටිකාලයේදී ආයතනයක පහත පිරිවැයන් හා නිෂ්පාදනය අතර පවතින සම්බන්ධතාවය සුදුසු රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

අ) මුළු ස්ථාවර පිරිවැය (TRC)
ආ) මුළු විචල්‍ය පිරිවැය (TVC)
ඉ) මුළු පිරිවැය (TC)
ඊ) මුළු සාමාන්‍ය පිරිවැය (ATC)

(ලකුණු 08)

ii. දිගුකාලයේදී ආයතනයක් නිමවුම වැඩි කිරීමේදී සාමාන්‍ය මුළු පිරිවැය ක්‍රමයෙන් අඩු වේ. මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ කෙසේද?

(ලකුණු 07)

05.

i. පාරිභෝගික හැසිරීම පිළිබඳ විග්‍රහ කිරීම සඳහා ඉදිරිපත් වී ඇති ප්‍රධාන විශ්ලේෂණ අතර පවතින සමානතා සහ අසමානතා මොනවාද?

(ලකුණු 07)

ii. පාරිභෝගිකයෙකු උපයෝගීතාවය උපරිම කර ගැනීම සඳහා සුදුසු භාණ්ඩ සංයෝගය තෝරා ගන්නා ආකාරය උපේක්ෂා වක්‍ර විග්‍රහය මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

06.

i. ගණකාධිකරණ ලාභය ආර්ථික ලාභයට වඩා සෑම විටම විශාල වේ. මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ ඇයි?

(ලකුණු 08)

ii. තරඟකාරී ආයතනයක් ලාභ උපරිම කරන නිමවුම තීරණය කරන ආකාරය සුදුසු රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

07.

i. වෙළඳපල වර්ගීකරණය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන නිර්ණායක මොනවාද?

(ලකුණු 07)

ii. ඒකාධිකාරී තරඟකාරී (Monopolistic Competition) වෙළඳපලක් පූර්ණ තරඟයෙන් (Perfect Competition) වෙනස්වන්නේ කෙසේද?

(ලකුණු 08)

**************************